**පොල් පර්යේෂණ මණ්ඩලය - 2019**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් පර්යේෂණ මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් අවශ්‍ය වන පරිදි දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු.1,539,783,874 ක් වූ ඉඩම් සහ පිරිවැය රු.187,578,610 ක් වූ ගොඩනැඟිලි 2005 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය සිදු කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර ඉඩම් 03 ක හිමිකම (බණ්ඩිරිප්පුව අක්කර 50 කොටස, වල්පිට වත්ත , අඹකැලේ වත්ත) තහවුරු කර ගැනීම සඳහා ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අදාළ හිමිකම තහවුරු කරන තෙක් ප්‍රත්‍යාගණනය සිදු නොකරයි. | ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.75,458,252 ක් වූ මෝටර් රථ 141 ක් දැනටමත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 අනුව නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව මෙම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණ කර නොතිබුණි. | රථවාහන ප්‍රත්‍යාගණනය 2021 වර්ෂයේ දී සිදු කර ගිණුම් වල ගැළපීමට කටයුතු කරන බව දන්වමි. | සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා වත්කම් වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කර අවශ්‍ය ගැළපීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයෙහි සේවක ප්‍රතිලාභ පාරිතෝෂිත ගණනය කිරීම සඳහා ආයුගණක තක්සේරු ක්‍රමය (Actuarial Valuation Method) භාවිතා කර තිබුණ ද, ප්‍රමිත අංක 19 හි 94 ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනට භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය වන සියයට 8.45 යොදා ගත යුතු වුවත් මණ්ඩලය විසින් සියයට 7 ක අනුපාතය භාවිතා කර රු.157,280,087 ක් ලෙස පාරිතෝෂිත වෙන්කිරීම සිදුකර තිබුණි. එසේම ප්‍රමිතියේ 141 ඡේදය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ ගණනයට අදාළව මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතු හෙළිදරව් කිරීම් මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි. | 2019 වර්ෂයේ පොලී අනුපාතයන් විශාල වශයෙන් උච්චාවචනය වූ බැවින් අනුපාතයේ සුළු වෙනසකින් පාරිතෝෂිත වෙන් කිරීම විශාල වශයෙන් වෙනස් වන බැවින් අප විසින් අදාළ අනුපාතය අන්තර්ජාලයෙන් ලබාගත් අතර එය සියයට 6.5 ක් වේ. එය සියයට 7 දක්වා වැටයීම සිදු කර ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ පාරිතෝෂිත ගණනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශේෂ පරීක්ෂණ ව්‍යාපෘති සඳහා ලැබී තිබුණු දේශීය හා විදේශීය ප්‍රදානවලින් දරන වියදමට සමාන ප්‍රමාණයක් ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත් මෙකී විශේෂ ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැයකර තිබුණු රු.123,187,475 ක් අදාළ ප්‍රදානවලින් අඩුකර ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ප්‍රාග්ධන පරිත්‍යාගවල වටිනාකම ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි. | විශේෂ ව්‍යාපෘති සඳහා දරන ලද දේශීය හා විදේශීය ප්‍රදාන ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගෙන එම එක් එක් ව්‍යාපෘතිය සඳහා යම් වර්ෂයකදී දරන ලද වියදමට සමානුපාතිකව එක් එක් ව්‍යාපෘතියට අදාළ ප්‍රදාන ගිණුමෙන් ලියාහරිනු ලබයි.නමුත් මෙයින් රු.21,447,817 ක ප්‍රමාණයක් මේ වන විටත් අවසන් වී ඇති ව්‍යාපෘති වලට අදාළ වන අතර එය අදායමක් ලෙස මේ වන තෙක් හඳුනාගෙන නොමැත. එබැවින් එය 2020වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. එමෙන්ම ඉතිරි ප්‍රමාණය වන රු.139,312,882 (160,760,699 - 21,447,817) ක මුදල සමන්විත වනුයේ තවමත් අවසන් නොවූ ක්‍රියාකාරී තත්වයේ පවතින ව්‍යාපෘති 5 කට අදාළ වටිනාකමයි. එම නිසා එම මුළු වටිනාකම එකවර ආදායමක් ලෙස හඳුනාගත හොත් එය ගිණුම් ගත කරන වර්ෂයට පමණක් සීමා වේ. එබැවින් එක් එක් ව්‍යාපෘතිය සඳහා ඉදිරියේ දී සිදු කරන වියදම් වලට සමානුපාතිකව අදාළ වර්ෂයේ ව්‍යාපෘති ගිණුම තුළින් ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | වර්ෂයක් පාසා දරන ලද වියදමට සමානුපාතික ආදායමක් අදාළ ප්‍රදාන ගිණුමෙන් ලියා හැරිය යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) හලාවත ප්‍රදේශයේ පිහිටි කිනියම බීජ පොල් උයනේ වැටක් ඉදිකිරීමට දරන ලද රු.1,988,350 ක වියදම සහ එම වැට ආවරණය සඳහා රු.947,298 කට මිලට ගත් Mesh Rolls සඳහා දරන ලද වියදම් ව්‍යාපෘති වියදම් යටතේ පුනරාවර්ථන වියදමක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය සහ වතු වැඩිදියුණු කිරීම් පිරිවැය රු. 2,935,648 බැගින් ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල දැක්වුණි. | 2020 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | වියදම් ගිණුම්ගත කිරීමේදී පුනරාවර්ථන වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්වල දැක්විය යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.1,425,000 ක රතු කුරුමිණි පාලන උපකරණ තොගයක් මිලදී ගැනීමට අදාළව වැරදි ජ'නල සටහන් විවිධ වියදම් ගිණුම, විවිධ ණයහිමි ගිණුම, දායකත්ව ප්‍රග්ධන ගිණුම, වත්කම් කපාහැරීම් ගිණුම හා ක්‍රමක්ෂය ගිණුම යන ගිණුම්වල සටහන් කිරීම හේතුවෙන් එම ගිණුම් වල පිළිවෙලින් රු.1,995,500 කින්, රු.1,425,000 කින්, රු.570,000 කින් සහ රු.570,000 කින් වැඩියෙන්ද ක්‍රමක්ෂය ගිණුම රු.570,000 කින් අඩුවනේද පනේවා තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිභාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ජ'නල් සටහන් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොල් වගාකිරීමේ මණ්ඩලයේ ලැබිය යුතු ගිණුම් ශේෂය රු.35,298,009 ලෙස දක්වා තිබුණත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය වාර්තා අනුව එයට අනුරූපී ශේෂය රු.42,129,005 ක් විය. මේ අනුව එම ශේෂයන් අතර රු.6,830,996 ක වෙනසක් නිරීක්ෂණය වුවද අදාළ වෙනස්කම් හඳුනාගෙන ශේෂ ගැළපීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු ශේෂයන් හි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) වැලිගම බීජ පොල් උයන බදු පදනම මත ලබා ගැනීම වෙනුවෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයට ගෙවිය යුතු රු.1,000,000 ක මූලික ගෙවීම සහ වාර්ෂිකව ගෙවිය යුතු රු.25,000 ක බදු මුදල් වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | පොල් වගා කිරීමේ මණ්ඩලය සමග සකස් කර තිබූ ගිවිසුමේ පැවති ගැටලුවක් හේතුවෙන් එය විසඳෙන තුරු වගකීමක් ලෙස නොපෙන් වූ අතර අදාළ ගැටලුව විසඳාගෙන 2020 වර්ෂයේ වගකීමක් ලෙස ගිණුම්ගත කරන බව දන්වමි. | ගිවිසුම් ප්‍රකාරව බැඳීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. |
| (ඊ) මණ්ඩලයේ වැටුප් ගිණුම් තැබීම සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංගය වැඩිදියුණු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.1,045,809 ක වියදමක් දරා තිබූ අතර එම වටිනාකම අස්පෘෂ්‍ය වත්කම් | 2020 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පරිගණක මෘදුකාංග අත්පත්කර ගැනීම්, වැඩිදියුණු කිරීම් මණ්ඩලයේ අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන ගිණුම්වල පෙන්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස ගිණුම්වල දැක්විය යුතු වුවත් පරිගණක අලුත්වැඩියා වියදමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (එ) | පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ වාරි පද්ධතියක් ඉදිකිරීමට අදාළව රඳවාගත් මුදල් රු.810,118 ක් ගිණුම් ගත කිරීමේදී විද්‍යාගාර හා ක්ෂේත්‍ර නඩත්තු වියදම් (Lab & Field Maintance – 880/93/38) ගිණුමට හර කර ණයහිමි ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.810,118 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ණයහිමි ගිණුමේ ශේෂය ද එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | වියදම් නිවැරදි ආකාරයෙන් වර්ගීකරණය කර ගිණුම්වල පෙන්විය යුතුය. |
| (ඒ) | පුත්තලම දිස්ත්‍රික්කයේ පල්ලම ප්‍රදේශයේ පිහිටි අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ බින්දු ජල සම්පාදන පද්ධතියට අදාළව රඳවා ගත් සියයට 5 ක රඳවා ගැනීම් මුදල වූ රු.476,199 ක මුදල නිදහස් කිරීමේදී රඳවා ගත් මුදල් ගිණුම හර කිරීම වෙනුවට විද්‍යාගාර හා ක්ෂේත්‍ර නඩත්තු වියදම් (Lab & Field Maintance – 880/ 93/ 36) ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම් සංකේත වල නිවැරදිභාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගණුදෙනු ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඔ) | කෘෂි ආර්ථික විද්‍යා අංශයේ සංඛ්‍යා ලේඛන විශ්ලේෂණය සඳහා රු.315,810 වටිනාකමට මිලටගෙන තිබූ පරිගණක මෘදුකාංග පද්ධතිය අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්වීම වෙනුවට පරිගණක උපාංග ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්වල පෙන්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,691,558 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.58,993,686 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.98,685,244 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පොල් සහ පොල් පැළයක විකුණුම් මිල වැඩි වීම හේතුකොට ගෙන සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වූ තොගය රු.52,875,444 කින් වැඩි වීම මෙහෙයුම් ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

ජංගම අනුපාතය ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා 1:1.42 සිට 1:0.925 දක්වා ද ක්ෂණික අනුපාතය 1:1.04 සිට 1:0.41 දක්වා ද අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 11.25 ක් වූ අලාභ අනුපාතය සියයට 6.60 ක ලාභයක් බවට පත්ව තිබුණි. පොල් සහ පොල් පැළ විකුණුම් මිල වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පොල් මයිටා හානිය මර්ධනය කිරීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම සඳහා පොල් පර්යේෂණ මණ්ඩලය 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.13,767,434 ක වියදමක් දරා තිබුණි.මයිටා උවදුර මර්ධනයට අදාළව 1999 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පොල් පර්යේෂණ මණ්ඩලය විසින් මයිටා මර්ධන නිර්දේශ ඉදිරිපත් කර තිබුණද 2014 වර්ෂයෙන් පසුව පොල් මයිටා මර්ධනය සඳහා කිසිදු නිර්දේශයක් ඉදිරිපත් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. මේ දක්වා පොල් පර්යේෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ නිර්දේශ අතරින් පොල් මයිටා උවදුර සැලකිය යුතු මට්ටමකට අවම කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙයට හේතුව එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ක්ෂේත්‍රයේදී ඇති වන ප්‍රායෝගික අපහසුතාවය බව විගණනයට වාර්තා කර තිබුණි. එම නිසා මෙම උවදුර මර්ධනය සඳහා ප්‍රායෝගික නව විසඳුම් සොයාගත යුතුව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | පොල් මයිටාවා වැනි පළිබෝධයෙකු සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකර නිර්දේශයක් නිකුත් කිරීමට දිගු කාලයක් ගතවේ. විශේෂයෙන් දැනටමත් සිදු කරමින් පවතින ජෛව විද්‍යාත්මක ක්‍රම සහ ප්‍රතිරෝධී ප්‍රභේද සම්බන්ධ පර්යේෂණ සිදුකර නිර්දේශයක් නිකුත් කිරීම සඳහා වසර 10 - 8 අතර කාලයක් ගත වේ .එය මෙම පර්යේෂණ වල සාමාන්‍ය ස්වභාවයයි. කෙටි කාලීන පර්යේෂණ වලින් නිර්දේශ නිකුත් කළ හැක්කේ කෘමිනාශක සඳහා වුවත් කෘමිනාශක භාවිතා කිරීම මෙවැනි පළිබෝධකයෙකු සඳහා ප්‍රායෝගික සහ තිරසාර ක්‍රමයක් නොවේ.<br>පොල් මයිටා මර්ධනය සඳහා අප ආයතනය මඟින් නිර්දේශයන් 2ක් මීට පෙර ඉදිරිපත් කර ඇත. මයිටා උවදුර සැලකිය යුතු ලෙස අවම කර ගැනීමට නොහැකි වී ඇත්තේ ගොවීන්ට මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ක්ෂේත්‍රයේදී ඇතිවන විවිධ ප්‍රායෝගික අපහසුතාවයයි. එබැවින් ඔවුන් ඒ සඳහා දැඩි උනන්දුවක් නොදක්වන බව පෙනී ගොස් ඇති අතර දැනටතමත් මේ සඳහා විසඳුම් සොයා ගැනීමට ප්‍රායෝගිකව ක්‍රමවේදයන් සිදු කළ යුතු බවට හඳුනාගෙන ඇත . | පොල් මයිටා හානිය මර්ධනයට ප්‍රායෝගික විසඳුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 2019 වර්ෂයේ අවසානයට පොල් පර්යේෂණ මණ්ඩලයේ බීජ පොල් නිෂ්පාදනය පොල් ගෙඩි 1,571,075 ක් වූ නමුත් 1998 වර්ෂයෙන් පසුව හඳුන්වා දී තිබූ කප්රුවන, කප්සුවය හා කප්සෙත යන විශේෂ පොල් ප්‍රභේද වල බීජ පොල් නිෂ්පාදනය ගෙඩි 11,930 ක් පමණක් විය. එය මුළු බීජ නිෂ්පාදනයෙන් 0.76 ක් පමණ ඉතා අඩු ප්‍රතිශතයක් විය. මෙම නිසා | 2014/2013 වර්ෂ වල පොල් පර්යේෂණ ආයතනය හලාවත වැවිලි සමාගම සමඟ ඒකාබද්ධව වසරකට කප්රුවන බීජ පොල් ලක්ෂ 2 ත් 3 ත් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම ඉලක්කගත කර බීජ පොල් උයනක් දැනටමත් ස්ථාපිත කර ඇත. ඒ අනුව ඉදිරියේදී බීජ නිෂ්පාදන කටයුතු සිදුවනු ඇත. ඊට අමතරව අත් | නව බීජ පොල් උයන් ස්ථාපිත කිරීම මඟින් කප්රුවන, කප්සුවය හා කප්සෙත යන පොල් ප්‍රභේද වල බීජ නිෂ්පාදනය වැඩිකර ජනතාව අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බීජ පොල් උයන් ස්ථාපිත කර බීජ නිෂ්පාදනය වැඩි කිරීමටත් ඉහත පොල් ප්‍රභේද වල බීජ නිෂ්පාදනය වැඩිකර ජනතාව අතර ව්‍යාප්ත කිරීමටත් මණ්ඩලයට නොහැකි වී තිබුණි. | පරාගනය මඟින් කප්රුවන, කප්සුවය හා කප්සෙත බීජ නිෂ්පාදන කටයුතු ආරම්භ කර මේ වන විටත් බීජ නිෂ්පාදනය කරමින් පවතී .එමෙන්ම කප්සුවය හා කප්සෙත බීජ උයන් ස්ථාපිත කිරීම විශේෂ ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති යෝජනාවක් 2019 වසරේ භාණ්ඩාගාරය වෙත යවා ඇත. | |
| (ඇ) | වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට ප්‍රතිරෝධතාවයක් පෙන්නුම් කරන දෙමුහුන් විශේෂයේ බීජ නිෂ්පාදනය කිරීම සඳහා බීජ පොල් උයනක් ස්ථාපනය කිරීමට වසර 10 ක බදු පදනම මත පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් අක්කර 16.15 ක වැලිගම බීජ පොල් උයන ලබා ගෙන තිබුණි. එකී උයනේ දෙමුහුන් බීජ නිෂ්පාදනය සඳහා මව් ශාක ලෙස කොළ කුන්දිරා සහ පිය ශාක ලෙස උස ශාක කුන්දිරා පැළ සිටුවීමට සැලසුම් කර තිබු නමුත් මව් ශාක හා පිය ශාක ප්‍රමාණය කොපමණද යන්න වෙන් වෙන්ව හඳුනා නොගෙන උයනේ සිටුවීමට අපේක්ෂිත පැළ ගණන ලෙස පැළ 900 ක් දක්වා තිබුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට මව් ශාක ලෙස පැළ 306 ක් පමණක් මුළු භූමි ප්‍රදේශයෙන් අක්කර 05ක් පමණක් උපයෝගී කරගෙන වගාකර තිබුණි. | වැලිගම පොල් කොල මැළවීමේ රෝගයට ප්‍රතිරෝධී පොල් පැළ නිෂ්පාදනය සඳහා බීජ පොල් උයනක් ස්ථාපනය කිරීමට ස්ථානයක් ලබා ගැනීමට විවිධ ආයතන සමඟ දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කළද ඒ සඳහා භූමියක් සොයා ගැනීමට නොහැකි විය. අවසානයේ පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් වැලිගම පිහිටි පොල් තවාන මේ සඳහා බදු පදනම යටතේ ලබා ගත් අතර එහි පොල් වගාව සඳහා පාංශු තත්ත්වය සිටුවීමට හැකි වූ මුලු මව්ශාක ප්‍රමාණය 306 කි . | පොල් කොළ මැලවීමේ රෝගයට ප්‍රතිරෝධතාවයක් පෙන්නුම් කරන දෙමුහුන් විශේෂයේ බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන දෙමාපිය ශාක ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනාගෙන සැලසුම් කර පරිදි වගා කර ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2017 වර්ෂයේ ආරම්භ කර සමාලෝචිත වර්ෂයේදී නිමවීමට සැලසුම්කර තිබූ පොල් නැවත වගාකිරීමේ ජාතික වැඩසටහන සඳහා උසස් අස්වැන්නක් සහිත පොල් පැළ නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ උතුරු ප්‍රදේශයේ ගෙවතු සඳහා දෙමුහුම් පොල් පැළ 2 බැගින් පවුල් 35,000 කට නොමිලේ පැළ 70,000 ක් ලබා දීමට අරමුණු කර ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට බෙදා දී තිබුණේ පොල් පැළ 20,000 ක් පමණි. පොල් පැළ නිෂ්පාදනය කර බෙදාහැරීමට ප්‍රමාද වීම මත සැලසුම් කළ පරිදි පොල් නැවත වගා කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | උසස් අස්වැන්නක් සහිත පොල් පැළ නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ මෙම වැඩසටහන 2017 වර්ෂයේ ආරම්භ කර සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට ඉලක්ක ගත ලෙස පොල් පැළ නිෂ්පාදනය සිදු කෙරිණි. 2018 වර්ෂයේ වැසි සමයේ පොල් පැළ බෙදීමට සූදානම් කළද පැවතුණ රජය වෙනස් වීම තුළ ඇතිවූ යම් අර්බුදකාරී තත්ත්වයන් මත අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට නොහැකි වීමෙන් එම කාල සීමාව තුළ පොල් පැළ බෙදා හැරීමට නොහැකි විය. ඉන්පසුව 2019 වර්ෂයේ උතුරු ප්‍රදේශයේ ඇතිවූ නියං තත්ත්වය හේතුවෙන් පොල් පැළ බෙදා හැරීමේ කාර්යය එම වර්ෂයේ අග භාගය තෙක් කල් දැමීමට සිදුවිය. මේ වන විටත් ඉතිරි නිෂ්පාදිත පොල් පැළ 50,000 බෙදා හැරීමේ කාර්යය සිදුකරමින් පවතී. | නොපමාව ව්‍යාපෘති ඉලක්ක සපුරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, කොතලාවල ආරක්ෂණ විද්‍යාපීඨය, ජල සම්පත් මණ්ඩලය වැනි ආයතන 08 ක් සඳහා දෙනු ලැබූ රු.4,067,534 ක් වූ අත්තිකාරම් වසර 1 සිට 5 දක්වා කාලයක සිට පියවා නොතිබුණි. | පේරාදෙණිය විශ්ව විද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, කොතලාවල ආරක්ෂණ විද්‍යා පීඨය යන ආයතන වලට අදාළ පර්යේෂණ කටයුතු තවමත් අවසන් වී නොමැති බැවින් එම අත්තිකාරම් ශේෂ ගිණුම් තුළ දක්වා ඇත. කෙසේ වෙතත් මේ වන තෙක් අවසන් කර ඇති ප්‍රමාණයට අත්තිකාරම පියවා නැවත අලුතින් අත්තිකාරමක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ලිපි මගින් ඔවුන් දැනුවත් කර ඇත .එමෙන්ම විභාග කොමසාරිස්, සන්ෆලවර් ලංකා ආයතනය සහ ජල සම්පත් මණ්ඩලයට ලබා දී ඇති අත්තිකාරම් පියවීම සඳහා අවශ්‍ය ලේඛන මේ වන විටත් ගිණුම් අංශය වෙත ලැබී ඇත. | අදාළ කාල සීමාව තුළ එකී කාර්යයන් නිම කරවා ගෙන අත්තිකාරම් පියවා ගැනීමට මණ්ඩලය කටයුතු කළ යුතුය. |
| (ඊ) | පලිබෝධ සහ රෝග පාලනය කිරීම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණවල නිරත වීම සහ පොල් සැකසීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අගය එක්කළ නිෂ්පාදන පිළිබඳ තවදුරටත් විද්‍යාත්මක පර්යේෂණවල නිරත වීම් යන කාර්යයන් සිදු කිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් මිලට ගෙන තිබූ රු.3,544,338 ක් වූ රසායනික ද්‍රව්‍ය තොග වසර 2 කටත් වැඩි කාලයක් භාවිතයකින් තොරව පැවතුණි. | පර්යේෂණ සැලසුම් කළ පසු ඒ සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය ඇණවුම් කරන අතර විවිධ අවස්ථාවන්හි දී විවිධ ප්‍රමාණයන්ගෙන් ඒවා භාවිතා කිරීම සිදුවේ. මෙම රසායන ද්‍රව්‍ය කෙටි කාලයක් තුළ කුඩා ප්‍රමාණයන්ගෙන් ලබා ගැනීම අපහසු වන අතර ඇණුවම් ඉදිරිපත් කර ලබා ගැනීමටද දීර්ඝ කාලයක් ගතවේ. එබැවින් අඛණ්ඩව පර්යේෂණ සිදු කරගෙන යාමේ පියවරක් ලෙස අවශ්‍ය රසායන ද්‍රව්‍ය තොග ප්‍රමාණ පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ. | අතිරික්ත තොග රැස් නොවන ලෙස තොග කළමනාකරණය කළ යුතුය. |
| (උ) | වර්ෂ 1992 – 2014 කාල පරාසය තුළ විදේශ ගතව නැවත සේවයට නොපැමිණි විදේශ ශිෂ්‍යත්වලාභීන් 09 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.28,588,853 ක මුදල අදාළ නිලධාරීන්ගෙන් සහ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම විදේශ සංචාර සඳහා නිලධාරීන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු.776,856 ක අත්තිකාරම් මුදල වර්ෂය අවසානය වන විටත්පියවා නොතිබුණි. | අදාළ කාලසීමාව තුළ (2014-1992) විදේශගතව සිට නැවත සේවයට වාර්තා නොකිරීම යන කාරණය මත එම ශිෂ්‍යත්වලාභීන් 09 දෙනා හා පොල් පර්යේෂණ ආයතනය අතර ඇතිකරගන්නා ලද ගිවිසුම උල්ලංඝනය කිරීම යන්න පදනම් කරගෙන මින් 07 දෙනෙකුට එරෙහිව මේ වන විට නඩු පවරා ඇති අතර, එම නඩු විභාග වෙමින් ඇත. තවද, මීට අමතරව පී.ජී.පී. හේවාවිතාරණ මිය හා ආචාර්ය එස්.සී .සෝමසිරි මෙනෙවිය යන අයට එරෙහිව නඩු කටයුතු ආරම්භ කරන ලෙස පොල් පර්යේෂණ ආයතනය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී නීතිමය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. | පවරා ඇති නඩු කඩිනමින් අවසන් කර මුදල් අයකර ගත යුතුය. තවද විදේශ සංචාර සඳහා නිලධාරීන් වෙත ලබා දෙන අත්තිකාරම් සංචාරය අවසානයේ අප්‍රමාදව පියවා ගැනීමට මණ්ඩලය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) 2011 වර්ෂයේ පොල් පර්යේෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩල පටිපාටිය අනුමත කරගෙන තිබුණද ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වතු), පර්යේෂණ නිලධාරී (යාන්ත්‍රික ඉංජිනේරු), වතු අධිකාරී, කාර්මික (මුද්‍රණ) හා රියදුරු යන තනතුරු 5 ට අදාල පුරප්පාඩු 05 සඳහා නිලධාරින් බඳවා ගැනීමට වසර 3 ත් 8 ත් කාලයක සිට නොහැකි වී තිබුණි. | පොල් පර්යේෂණ ආයතනයේ සේවා අවශ්‍යතාවය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපි අංක DMS/ E4/ 08 /4/ 074/ 1-1 දරන 2011 06.01.දිනැති ලිපියෙන් කාර්ය මණ්ඩලය අනුමත කර ගෙන ඇත.<br><br>පළපුරුද්ද සහ වයස් සීමාව යන මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සොයා ගැනීමට අපහසුවීම මත ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වතු) තනතුරත්, සුදුසුකම් සහිත අයදුම්පත් ලැබුණද ඔවුන් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී නොසිටීම මත පර්යේෂණ නිලධාරි (යාන්ත්‍රික ඉංජිනේරු) තනතුරත්, මුදල් අමාත්‍යාංශය විසින් තාවකාලිකව බඳවා ගැනීම් නවත්වා තිබීම මත වතු අධිකාරී තනතුරත්, අවස්ථා කිහිපයකදී පුවත්පත් දැන්වීම් පල කළද අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් නොලැබීම මත කාර්මික (මුද්‍රණ) තනතුරත්, මුදල් අමාත්‍යාංශය විසින් තාවකාලිකව බඳවා ගැනීම් අත්හිටුවීම මත රියදුරු තනතුරේ පුරප්පාඩු 8 කුත් පිරවීමට නොහැකිව ඇත. | 2011 වර්ෂයේ අනුමතව ඇති මෙම තනතුරු සඳහා වූ පුරප්පාඩු පිරවීමට හෝ සුදුසු අයදුම්කරුවන් නොමැති නම් කාර්ය මණ්ඩල පටිපාටිය සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |